INTRODUCING 1st TIME IN UK
FareDeals Travel & Tours
Fly With Someone You Trust
FareDeals Travel & Tours Ltd.
458, Alexandra Avenue, Rayner's Lane, (Opp:Tube). HA2 9TL. United Kingdom.

- All Deals Available in Colombo Market (in Rupees)
- Cheaper than Leading Agents in Colombo
- We deliver Tickets to your Door Step in Sri Lanka
- No Middlemen, Book Directly with us in London

Fly to Colombo

| | |
|---|---|
| Srilankan Air | £ 380 |
| Qatar Air | £ 290 |
| Kuwait Air | £ 260 |
| Oman Air | £ 190 |
| Ethihad Air | £ 350 |

Buy your COLOMBO to LONDON/ UK, Australia, Italy, USA, Tickets. pay in pounds or rupees.

Fly to London / UK

| | |
|---|---|
| Srilankan | Rs. 85000* |
| Qatar | Rs. 62000* |
| Kuwait | Rs. 56000* |
| Royal Jor | Rs. 58000* |

Student Offers (o/way)

| | |
|---|---|
| Srilankan | Rs. 42000 |
| Qatar | Rs. 58000* |
| Kuwait | Rs. 41200* |

* Fares subject to taxes/change

Contact - Dulip, Nimesha, Sunirma or Fernando.
Emergency Travel ctc Dulip 07551549559
0208 150 9183
Call us 0800 612 4045 info@faredealtravels.co.uk
ETIHAD Emirates CATHAY PACIFIC KUWAIT AIRWAYS SriLankan QATAR AIRWAYS

# විජයග්‍රහණයේ සදා සිහිවටනය අලිමංකඩ රණවිරු ස්මාරකය

වසර 30 ක් පුරා පැවති ලංකා ඉතිහාසයේ දරුණුම ත්‍රස්තවාදී කුරිරු යුද්ධය විජයග්‍රාහීව අවසන් කරමින් ලංකා දේශයට සැනසුම් සුසුමක් හෙලන්නට ලැබූ අවස්ථාව සහ ඒ සඳහා ජීවිත පරිත්‍යාග කළ දහස් ගණනක් අභීත රණවිරුවන්ද ආබාධිත රණවිරුවන්ද, දැනට ජීවත්වන සියළු රණවිරුවන්ටද මුළු මහත් ජාතියේ ප්‍රණාමය හා උපහාර පුදකිරීම් වශයෙනුත්, ඔවුන් හැමදාටම සිහිපත් වනු පිණිසත් උතුරේ දරුණු සටන් නිරන්තරයෙන් පැවති අලිමංකඩ දර්ශණීය රණවිරු ස්මාරක යක් ඉදිකරන ලද්දේය. එය ගිය 30 දින උත්සවශ්‍රීයෙන් විවෘත වූයේ ආරක්‍ෂක ලේකම් ගොඨාභය රාජපක්‍ෂ මහතා සහ ත්‍රිවිධ හමුදාපතීන්ද විවිධ තරාතිරමේ හමුදා නිලධාරීන්ගේද සහභාගිත්වයෙනි

අලිමංකඩ වනාහි යාපන අර්ධවීපයට ඇතුල්වන දොරටුව යයි කිවහොත් වඩා නිවරදය. එය 2000 දී කොටි ත්‍රස්තවාදීන් අතට ගොස් නැවත 2009 ජනවාරියේදී ලංකා හමුදාවන් විසින් අත්පත් කරගන්නා ලදී. 53, 55, 57, 58 යන හමුදා සේනාංක මුණ ගැසුණේ අලිමංකඩදීය. මෙම දර්ශණීය කලාත්මක ස්මාරකය නිර්මාණය කරන ලද්දේ ශ්‍රීලංකා ජාතික සැළසුම් මධ්‍යස්ථානය විසිනි. යටිතල පහසුකම් හමුදාවෙනි. ස්මාර කය මුදුනේ ශ්‍රීලංකාව අත් හතරකින් ඔසවාගෙන සිටින ආකාරය දැක්වේ.





## Historic gun battle memories at Elephant Pass immortalized

Immortalizing memories of the fierce gun battles, fought by valiant War Heroes at the strategic Elephant Pass, a special **War Hero Memorial**, erected in honour of fallen War Heroes, was ceremonially unveiled by Secretary Defence **Mr Gotabaya Rajapaksa** Friday (30) morning, amidst a pantheon of military chiefs, including **Chief of Defence Staff, Commander of the Army and Commander of the Navy.**

## ♥ පැටියො ඩාලිං



" පැටියො ලොකු අම්ම සිංහල අවුරුද්දට අපිට එවපු කොකිස් පාර්සලේ මේ අදයි අනේ හම්බ-වුණේ....අපෝ ඒව ගන්න දෙයක් නෑ... ඔක්කොම පිටි වෙන්න කුඩුවෙලා....අපරාදෙ... "

" කියලා යවන්න මීට පස්සෙ අපිට මෙහාට කොකිස් එවන්න එපාය... පිටි පාර්සලේකුයි... කොකිස් අච්චුවකුයි එව්වම ඇතිය ... එතකොට අපි මෙහේ කොකිස් හදාගන්නම් කියලා.... "

## Sinhala Lesson 09 සිංහළ පාඩම

### සිංහල ඉගෙනීමට පහසු මගක් !

පහත දැක්වෙන සිංහල අකුරු ශබ්දකරන්නේ ඊට යටින් ඇති ඉංග්‍රීසි වචනයේ ඉරිගසා ඇති කොටස හඬ නැගෙන විධියට බව දරුවන්ට කියා දෙන්න.

**The sound of each Sinhala letter corresponds to the underlined part of the English word. Now read aloud the Sinhala letter.**

### Vowel Strokes



| | | | | |
|---|---|---|---|---|
| ත | තා | තැ | තෑ | ති |
| thumb | lethargic | thatch | thank | thin |
| තී | තු | තූ | තෙ | |
| thief | Lithuania | Anthurium | theft | |
| තේ | තො | තෝ | ත් | |
| Thames | thong | thaw | both | |

♦ ආචාර්යා සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

## හරස්පද ප්‍රහේලිකා 119

**හරහට :**
1 මැතිරීමෙන් කරන හානි
3 ගංගා 5 හැමතැනම නැති
7 දිවට දැනේ 9 පාඩු
10 කලවම්
11 ලෝහ වර්ගයකි

**පහළට :**
1 කොටන දෙයකි
2 පයිප්ප
4 දිවයින හෝ පහන
6 රෝගයකි
8 ඉතා සාරවත් 9 තුරහා

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | ■ | 3 | 4 |
| 5 | | 6 | ■ | |
| | ■ | 7 | 8 | |
| ■ | 9 | | | ■ |
| 10 | | ■ | 11 | |

**ගියවර නිවැරදි විසඳුම්**

**හරහට :** 1 විස 3 දුක 5 යතුර 7 බාලයා 9 ජනතා 10 කුඩ 11 වක
**පහලට :** 1 වියරු 2 සතු 4 කඩියා 6 රබාන 8 ලතාව 9 ජඩ

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

### බතල සලාදයක්
### Sweetpotato Salad

***අවශ්‍ය ද්‍රව්‍ය :***
බතල ගෙඩි කීපයක්
ලූනු ග්‍රෑම් 200 යි
වියලි කැලි මිරිස් මේස හැඳි 1 යි
උම්බලකඩ කුඩු මේස හැඳි 1 යි
දෙහි යුෂ හෝ සියඹලා යුෂ ටිකක්
රම්පෙ කරපිංචා සහ කුරුඳු පොතු
ලුණු අවශ්‍ය පමණට
බදින එළවළු තෙල් ස්වල්පයක්

***සාදන ක්‍රමය :*** සාස්පානකට තෙල් ටික දමා ලිප තබන්න. ලියාගත් ලූනු, රම්පෙ, කරපිංචා, කුරුඳු පොතු ගැඹුරු තෙලේ බදින්න. රන්වන් පැහැයට බැදීගෙන එනවිට තෙල් පෙරා ඉවත් කරන්න. යළිත් එම ලූනු ටික ලිප තබා උම්බලකඩ, කැලි මිරිස්, ලුණු සහ සියඹලා යුෂ දමා හොඳින් කළවම් කරන්න. හොඳට බැදෙන්න හැර ලිපෙන් බාගෙන දෙහි යුෂ දැම්මත් වරදක් නැත. සියඹලා නම් ලිපේ තිබියදී දැමිය යුතු අතර, දෙහි යුෂ නම් බිමට බාලා එකතු කළ යුතු වන්නේය. මෙය බෝතලයක දමා සති දෙකක් වුවත් තබාගත හැකි ය.

බතල ටික සෝදා තම්බන්න. සිහින්ව පෙති කපන්න. ඉහතින් සාදාගත් සම්බෝලය මෙම බතල කැලි මතට දමා මිශ්‍රකරගෙන කෑමට ගන්න. මීට පොල් ටිකක් ද එකතු කරගත් විට ඉතා රසවත් ආහාරයකි.

*බතල වෙනුවට මඤ්ඤොක්කා හෝ වෙනත් අල වර්ගයක් හෝ වුව ද යොදාගත හැකි ය.*

***ගල්කිස්ස මහ හෝටලයේ ප්‍රවීන සූපවේදී***
***♦ ආචාර්ය පබ්ලිස් සිල්වා*** Sri Lanka

Sam's CHICKEN CHICKEN CHICKEN
සැම්ස් චිකන්
Great Tasting! Great Value!
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 4ZJ, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432